# කාර්ය සාධන වාර්තාව
## செயலாற்றுகை அறிக்கை
# Performance Report

2019.01.01 – 2019.03.31

**(1 වන කාර්තුව, 1ம் காலாண்டு, 1st Quarter)**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සීමා නිර්ණය කොමිෂන් සභාව**
இலங்கை சனநாயக சோசலிசக் குடியரசின எல்லை நிர்ணய ஆணைக்குழு
**Delimitation Commission of Democratic Socialist Republic of Sri Lanka**

**සීමා නිර්ණය කොමිෂන් සභාව**

**2019 වර්ෂයේ ප්‍රථම කාර්තුවේ කාර්ය සාධන වාර්තාව**

**2019 ජනවාරි 01 සිට 2019 මාර්තු 31 දක්වා**

## 1.0 පසුබිම

වර්තමාන සීමා නිර්ණය කොමිෂන් සභාව 2015.11.13 දින ස්ථාපනය කරන ලද්දේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 41B හා 95(1) ව්‍යවස්ථාවන්ට අනුකූලවය. අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා ආචාර්ය කේ.තවලිංගම්, සාමාජිකයන් වන ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක හා මහාචාර්ය එස්.එච්.හස්බුල්ලා යන තිදෙනාගෙන් සමන්විත විය. 2018.08.24 වන දින මහාචාර්ය හස්බුල්ලා අභාවප්‍රාප්ත විය. 2019.03.11 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් එම පුරප්පාඩුවට අනුප්‍රාප්තිකයා ලෙස ඒ.එම්. නහියා මහතා පත් කරන ලදි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථා වලින් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් කියැවේ. කෙසේ වුවද අනිකුත් කොමිෂන් සභා සම්බන්ධයෙන් මෙන් නොව මෙම සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් නොවේ.

- කොමිෂන් සභාවේ කාර්යයන්
- කොමිෂන් සභාවේ බලතල

ආරම්භයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉඟිකරන ලද අදහස වූයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරන අවස්ථාවේදී හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කරන අවස්ථාවේදී තනි සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවීමට හා එහි වගකීම් භාරය විස්තර කරන විට සියලුම භූගෝලීය සීමා මායිම් නිර්ණය කිරීම න්‍යායානුගත කිරීමට කටයුතු කරන බවය.

## 2.0 දැක්ම:- සාදාචාරාත්මක හා සාධාරණ මුලධර්ම මත සීමා නිර්ණය කිරීමෙහි විශිෂ්ඨත්වය කරා ලඟා වීම

**මෙහෙවර-:**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබී ඇති පරිදි ස්වාධීන ලෙස හා සදාචාරාත්මක ලෙස, කාර්යක්ෂමවද, පාරදෘශ්‍යතාවයෙන් යුක්තවද, විශ්වසනීය ලෙස හා නීතියට අනුකූලව සීමා නිර්ණය කිරීම.

**අරමුණු**

- සෑම ඡන්ද දායකයෙකුටම හෝ පුරවැසියෙකුටම ඉහළම ප්‍රමාණයෙන් සමාන නියෝජනයක් ලැබෙන පරිදි හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම් හා එම වාතාවරණය සුරක්ෂිත වන ලෙස හා කාර්යක්ෂම ලෙස තහවුරු කිරීම සඳහා මැතිවරණ කොට්ඨාස හා වෙනත් පරිපාලන ඒකක සීමාවන් නිර්ණය කිරීම.
- මැතිවරණ කොට්ඨාස හෝ පරිපාලන ප්‍රදේශ හෝ අධ්‍යාපන , සෞඛ්‍ය හෝ ආරක්ෂක වැනි සමාජ - ආර්ථික සේවාවන් සඳහා නිර්ණය කිරීමට භාරදෙන, සීමා නිර්ණයන් නියමිත කාල රාමුව තුල නිම කිරීම.
- රජයට හා වෙනත් ආයතන වලට ස්වකීය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සීමා නිර්ණයන්හිදි අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දිම.
- සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා අදාළ ලියකියවිලි එක් රැස්කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.

## 3.0 ප්‍රතිපත්තිමය කරුණු

### 3.1 ක්‍රියාකාරි සැලැස්ම

වර්ෂය තුළදී අපේක්ෂිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සිදු නොවීය. එබැවින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. කෙසේ වුවද පහත ක්‍රියාකාරකම් ඇතුළත් කර 2019 ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදි. (ඇමුණුම 01)

1. සැලසුම්කරණය හා පුහුණුව
2. තොරතුරු එක් රැස් කිරීම(පරිපාලන ඒකක හා පළාත් පාලන ආයතන පිහිටුවීමට අදාළ සියලුම ගැසට් නිවේදන එකතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.)
3. ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහණය හා ඉඩකඩම් පිළිබඳ ප්‍රමුඛතා පෙරදැරිකොට පසුගිය පාර්ලිමේන්තු ඡන්ද විමසීම් හා බැදි සීමා නිර්ණය වාර්තා විශ්ලේෂණය කිරීම
4. පරිපාලන කොට්ඨාස වල සීමා පිළිබඳව අධ්‍යයනය
5. පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීම පිළිබඳ අධ්‍යයනය
6. වර්තමානයට ගැලපෙන වාර්තා / ලේඛනාගාරයක් සකස් කිරීම හා ලේඛනවල මෘදුකාංග පිටපත් සකස් කිරීම

### 3.2 පළාත් සභා සඳහා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරිම

2017 පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත 2017.09.20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි. 2017.10.04 දින ජනාධිපතිවරයා විසින් මේ කාර්යය සඳහා සීමා නිර්ණය කමිටුවක් පත්කරන ලදි. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයන් දෙදෙනාද මෙම කමිටුවේ සාමාජිකයන් බවට පත් කරන ලදහ. සම්පූර්ණ කරන ලද වාර්තාව 2018.02.19 වන දින පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාට භාරදෙන ලදි. එය 2018.03.06 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදි. 2018.08.24 දින එම වාර්තාව විවාදයට පාත්‍ර විය. ඉන් පසු එය සමාලෝචන කමිටුවකට යොමු කරන ලදි. වාර්තාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව ගන්නා ඊලඟ පියවර පිළිබඳව සීමා නිර්ණය කොමිෂන් සභාව අවධානයෙන් සිටී.

## 4.0 ගත වූ මාස තුන තුළ කාර්ය සාධනය

### 4.1 රැස්වීම්

**සීමා නිර්ණය කොමිෂන් සභාවේ රැස්වීම්:-** මෙම කාර්තුව තුළ පරිපාලන හා ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් තුනක් පවත්වන ලදි.

34 වැනි රැස්වීම - 2019.01.10
35 වැනි රැස්වීම - 2019.02.07
36 වැනි රැස්වීම - 2019.03.06

### 4.2 සීමා නිර්ණය හා ඊට අදාළ ගැටලු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

සීමා නිර්ණය මාතෘකාව හා ඊට අනුශාංගික වූ ගැටලු පිළිබඳ මහජන අවබෝධය ඉහළ නංවාලීම සඳහා පුවත්පත් වලට ලිපි සැපයීමට හා කොමිෂන් සභා සාමාජිකයන්ගේ සම්පත් දායකත්වයෙන් වෘත්තිකයන්ගේ සංවිධාන සාමාජිකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීමට සීමා නිර්ණය කොමිෂන් සභාව සැලසුම්කර ඇත.

මෙහිදී ප්‍රධාන වශයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය, මැතිවරණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා සුදුසු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

ඒ අනුව සභාපතිවරයාගේ සම්පත් දායකත්වයෙන් සීමා නිර්ණය හා ඊට අනුශාංගික වූ ගැටලු පිළිබඳ දැනුවත් කරමින් 2019.01.21 වන දින යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට දේශනයක් පැවැත්වූ අතර 2019.01.26 වන දින මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට සහ 2019.03.21 දින දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේදීද දැනුවත් කිරීමේ දේශනයන් පවත්වන ලදී.

තවද සීමා නිර්ණය විෂය පිළිබඳව මහජන අවබෝධය ඉහළ නංවාලීම සඳහා ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක විසින් 2018.10.28 දින Sunday Island ඉංග්‍රීසි පුවත්පතේද 2018.12.09 වන දින Sunday Times පුවත්පතේද ලිපි දෙකක් පළ කරන ලදී. එම ලිපි වලට සමගාමීව 2019.02.10 දිනද Sunday Island ඉංග්‍රීසි පුවත්පතේ "Delimitation of Electoral Boundaries in Sri Lanka Smaller Electoral Units Needed to Serve the People Better" යන මාතෘකාව යටතේ තුන්වන ලිපිය පළකරන ලදී.

## 5.0 පරිපාලනමය හා මූල්‍ය කරුණු

### 5.1 සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා කාර්යාල පහසුකම්

2016 වර්ෂයේ සිට සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යාලය මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කුලී ගෙවීමකින් තොරව පවත්වාගෙන යාමට මැනුම්පතිවරයා ඉඩ සලසා දී ඇත.

**වර්තමාන කාර්යාලයීය ලිපිනය**
සීමා නිර්ණය කොමිෂන් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාල ගෙඩනැගිල්ල
තැ.පෙ.506
කොළඹ 05

### 5.2 ප්‍රවාහන කටයුතු

මහා භාණ්ඩාගාරය විසින් සීමා නිර්ණය කොමිෂන් සභාවට 2016 වසරේදී වාහන 2ක් ලබා දෙන ලදී. CAP 7180 දරණ වාහනය ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචි කර එනමින් රක්ෂණය කර ඇති අතර එය සභාපතිවරයා සඳහා වෙන් කර ඇත. දෙවැනි මෝටර් රථය CAR 0347 ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අනුයුක්ත කරන ලදී. මෙම වාහන සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සියලුම ප්‍රවාහන කටයුතු සඳහා තවදුරටත් යොදාගනු ලැබේ.

### 5.3 සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම

සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරෙන කාර්යභාරයේ භාරදූරත්වය සලකා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ 2016.02.05 දිනැති අංක DMS/1029 ලිපියෙන් පහත සඳහන් පත්වීම් අනුමත කර ඇත.

| තනතුර | මට්ටම | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේතය |
|---|---|---|---|
| ලේකම් | ජ්‍යෙෂ්ඨ | 01 | SL-3-2006 |
| ගණකාධිකාරී | ජ්‍යෙෂ්ඨ | 01 | SL-1-2006 |
| සම්බන්ධීකරණ ලේකම් | තෘතියික | 01 | රා.පරි.ච. 6/2006 |
| පරිපාලන නිලධාරී | තෘතියික | 01 | MN-7-2006 |
| භාෂා පරිවර්තක | ද්විතියික | 03 | MN-6-2006 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ද්විතියික | 02 | MT-1-2006 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ද්විතියික | 02 | MN-2-2006 |
| රියදුරු | ප්‍රාථමික | 02 | PL-3-2006 |
| කාර්යාල සහයක | ප්‍රාථමික | 02 | PL-1-2006 |
| එකතුව | | 15 | |

මෙම කාර්තුව තුළ පහත සඳහන් පත්වීම් සිදුකර ඇත.

- වැඩ බලන ලේකම් - සමන් ශ්‍රී රත්නායක මහතා -: 2019 මාර්තු 21 දින සිට වැඩ බලන ලේකම්වරයාගේ පත්වීම වසරකට දීර්ඝ කර ඇත.
- වැඩ බලන ගණකාධිකාරී - එච්.ඩබ්.එන්.කුමාර මහතාගේ පත්වීම් කාලය 2019.03.31 න් අවසන් අතර 2019 අප්‍රේල් 01 දින සිට වැඩ බලන ගණකාධිකාරී ලෙස එස්.ටී.බුලත්සිංහල මහතා පත් කර ඇත.

මේ අනුව 2019.03.31 දින වන විට සේවා නියුක්තිය පහත පරිදි වේ.

| තනතුර | අනුමත | පුරවන ලද | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 [a] | - |
| ගණකාධිකාරී | 01 | 01 [a] | - |
| සම්බන්ධිකරණ ලේකම් | 01 | 01 | - |
| පරිපාලන නිලධාරී | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 03 | 0 | 03 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 0 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 02 | - |
| රියදුරු | 02 | 02 | - |
| කාර්යාල කාර්ය සහයක | 02 | 02 | - |
| එකතුව | 15 | 10 | 05 |

[a] අර්ධ කාලීන

## 6.0 නොවිසඳුනු කාරණා

සීමා නිර්ණය කොමිෂන් සභාව සිය ද්විතීය හා තෘතීය කාර්තුවල වාර්තාවලින් ඉස්මතුකොට දක්වන ලද නොවිසඳුනු ගැටලු සම්බන්ධයෙන් ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී. ඒවා නම්,

1. පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සීමා නිර්ණය කොමිෂන් සභාවට නියමිත කාර්යභාරයක් නියම වී නැත. මේ අතර ශ්‍රී ලංකාවේ පවත්නා අනපනත් හා කාර්ය පටිපාටි කිහිපයක් මඟින් මැතිවරණ කොට්ඨාස හා පරිපාලන මට්ටම්වල විවිධාකාරයේ සීමා නිර්ණයන් සිදු වෙමින් පවතින අතර මෙම ප්‍රශස්ත ප්‍රතිලාභ ලැබීමට නම් ඒ සියල්ල යථායෝග්‍ය ලෙස සිදු කළ යුතුය.
2. එවන් තත්වයක් ඇති කිරීමේ අරමුණින්,
   - 2016 ජූලි මාසයේදී "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය භාරය පුලුල් කිරීම යන මැයෙන් යුතු ප්‍රතිපත්ති යෝජනාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.
   - එම යෝජනාවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුවේ රාජ්‍ය සේවය පිළිබඳ පාර්ලිමේන්තු අනු කමිටුවේ ලේකම්වරයා වෙත, සභාපතිවරයා විසින් සකස්කරන ලද " නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් සකස්කරන විට සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතු කාරණා." යනුවෙන් වූ ඇමුණුමක්ද සහිතව 2016 ජූලි මස ඉදිරිපත් කරන ලදි. මෙම යෝජනාව අනු කමිටුවේ සැලකිල්ලට භාජනය විය.
   - නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේදී හෝ ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කරන විටදී සැලකිල්ලට භාජනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය කිරීම සඳහා වූ මූලධර්මය ප්‍රතිපත්ති රාමුව" යන මැයෙන් සකස් කරන ලද ලිපියක් 2016 ඔක්තෝබර් මාසයේදී එහි සභාපතිවරයා වන ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යවන ලදි.
3. සීමා නිර්ණය කොමිෂන් සභාවට මෙම යෝජනා සම්බන්ධයෙන් ලැබෙන ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී.

ඇමුණුම -1

# සීමා නිර්ණය කොමිෂන් සභාව

# 2019 - වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

# දැක්ම

සදාචාරාත්මක හා සාධාරණ මුලධර්ම මත සීමා නිර්ණය කිරීමෙහි විශිෂ්ඨත්වය ලබා ගැනිම.

.

# මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබි ඇති පරිදි ස්වාධින ලෙස , සදාචාරාත්මක ලෙස , සාධාරණ ලෙස , කාර්යක්ෂමව , පාරදෘෂ්‍යභාවයෙන් යුතුව විශ්වසනීය ලෙස හා නීතියට අනුකුලව සීමා නිර්ණය කිරිම.

# අරමුණු

- සෑම ඡන්ද දායකයෙකුටම හෝ පුරවැසියෙකුටම සමාන ඉහළම ප්‍රමාණයෙන් සමාන නියෝජනයක් ලැබෙන පරිදි හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම් හා එම වාතාවරණය සුරක්ෂිත වන ලෙස හා කාර්යක්ෂම ලෙස තහවුරු කිරිම සඳහා මැතිවරණ කොට්ඨාස හා වෙනත් පරිපාලන ඒකක සීමාවන් නිර්ණය කිරිම.
- මැතිවරණ කොට්ඨාස හෝ පරිපාලන ප්‍රදේශ හෝ අධ්‍යාපන , සෞඛ්‍ය හෝ ආරක්ෂක වැනි සමාජ - ආර්ථික සේවාවන් සඳහා නිර්ණය කිරිමට භාරදෙන, සීමා නිර්ණයන් නියමිත කාල රාමුව තුල නිම කිරිම.
- රජයට හා වෙනත් ආයතන වලට ස්වකීය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සීමා නිර්ණයන්හිදි අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දිම.
- සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා අදාළ ලියකියවිලි එක් රැස්කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.

## කාර්ය භාරය / නෛතික ප්‍රතිපත්ති

1.ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජ ව්‍යවස්ථාවේ අදාළ සියලුම විධිවිධාන.

# පටුන


| | | |
|---|---|---|
| 01 | සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩල තොරතුරු .................................................................................... | 01 |
| 02 | වර්ෂය සඳහා අයවැය ලේඛනය .................................................................................................... | 03 |
| 03 | ක්‍රියාකාරකම් සැලැස්ම .......................................................................................................... | 04 |
| 04 | ප්‍රසම්පාදන සැලැස්ම ............................................................................................................ | 10 |
| 05 | අනුමත වියදම් සැලසුම් අනුව මාසික / කාර්තුමය මුදල් ප්‍රවාහ ප්‍රකාශය ..................................................... | 11 |

# 01. සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩල තොරතුරු

## A. සංවිධාන ව්‍යුහය



## B. සීමා නිර්ණය කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය

සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරෙන කාර්යභාරයේ භාරදූරත්වය සලකා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ 2016.02.05 දිනැති අංක DMS/1029 ලිපියෙන් පහත සඳහන් පත්වීම් අනුමත කර ඇත.

| තනතුර | මට්ටම | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේතය |
|---|---|---|---|
| ලේකම් | ජ්‍යෙෂ්ඨ | 01 | SL-3-2006 |
| ගණකාධිකාරි | ජ්‍යෙෂ්ඨ | 01 | SL-1-2006 |
| සම්බන්ධීකරණ ලේකම් | තෘතියික | 01 | රා.පරි.ච. 6/2006 |
| පරිපාලන නිලධාරි | තෘතියික | 01 | MN-7-2006 |
| භාෂා පරිවර්තක | ද්විතියික | 03 | MN-6-2006 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ද්විතියික | 02 | MT-1-2006 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ද්විතියික | 02 | MN-2-2006 |
| රියදුරු | ප්‍රාථමික | 02 | PL-3-2006 |
| කාර්යාල සහයක | ප්‍රාථමික | 02 | PL-1-2006 |
| එකතුව | | 15 | |

**2018.12.31** දින වන විට සේවා නියුක්තිය

| තනතුර | අනුමත | පුරවන ලද | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 [a] | - |
| ගණකාධිකාරි | 01 | 01 [a] | - |
| සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 03 | 0 | 03 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 0 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 02 | - |
| රියදුරු | 02 | 02 | - |
| කාර්යාල කාර්ය සහයක | 02 | 02 | - |
| එකතුව | 15 | 10 | 05 |

a වැඩ බලන

## 02. වර්ෂය සඳහා අයවැය ලේඛනය

### HEAD - 25 Delimitation Commission
### 01 - Operational Activities
### 01 - General Administration and Establishment Services

Rs '000

| Sub Project / Object / Item / Finance Code | Category/Object/Item Description | 2017 | 2018 Revised Budget | 2019 Estimate | 2020 Projections | 2021 Projections | 2018 - 2021 Total |
|---|---|---|---|---|---|---|---|
| | **Recurrent Expenditure** | **18,961** | **14,015** | **15,055** | **16,390** | **17,215** | **62,675** |
| | **Personal Emoluments** | **10,988** | **9,484** | **10,100** | **11,060** | **11,470** | **42,114** |
| 1001 | Salaries and Wages | 5,119 | 6,105 | 7,000 | 8,000 | 8,250 | 29,355 |
| 1002 | Overtime and Holiday Payments | 229 | 292 | 100 | 110 | 120 | 622 |
| 1003 | Other Allowances | 5,641 | 3,087 | 3,000 | 2,950 | 3,100 | 12,137 |
| | **Travelling Expenses** | **29** | **160** | **270** | **285** | **300** | **1,015** |
| 1101 | Domestic | 29 | 60 | 70 | 75 | 80 | 285 |
| 1102 | Foreign | | 100 | 200 | 210 | 220 | 730 |
| | **Supplies** | **1,909** | **1,331** | **1,415** | **1,540** | **1,675** | **5,961** |
| 1201 | Stationery and Office Requisites | 436 | 450 | 400 | 420 | 450 | 1,720 |
| 1202 | Fuel | 1,465 | 873 | 1,000 | 1,100 | 1,200 | 4,173 |
| 1203 | Diets and Uniforms | 8 | 8 | 15 | 20 | 25 | 68 |
| | **Maintenance Expenditure** | **170** | **375** | **450** | **490** | **540** | **1,855** |
| 1301 | Vehicles | 135 | 250 | 300 | 320 | 350 | 1,220 |
| 1302 | Plant and Machinery | 14 | 75 | 100 | 110 | 120 | 405 |
| 1303 | Buildings and Structures | 20 | 50 | 50 | 60 | 70 | 230 |
| | **Services** | **5,866** | **2,640** | **2,800** | **2,990** | **3,200** | **11,630** |
| 1401 | Transport | 897 | 1,250 | 1,400 | 1,500 | 1,600 | 5,750 |
| 1402 | Postal and Communication | 386 | 450 | 600 | 620 | 650 | 2,320 |
| 1403 | Electricity & Water | 178 | 200 | 300 | 320 | 350 | 1,170 |
| 1409 | Other | 4,405 | 740 | 500 | 550 | 600 | 2,390 |
| | **Transfers** | | **25** | **20** | **25** | **30** | **100** |
| 1506 | Property Loan Interest to Public Servants | | 25 | 20 | 25 | 30 | 100 |
| | **Capital Expenditure** | **674** | **725** | **820** | **805** | **800** | **3,150** |
| | **Acquisition of Capital Assets** | **641** | **600** | **570** | **545** | **530** | **2,245** |
| 2102 | Furniture and Office Equipment | 99 | 100 | 70 | 75 | 80 | 325 |
| 2103 | Plant, Machinery and Equipment | 542 | 500 | 400 | 420 | 450 | 1,770 |
| 2106 | Software Development | | | 100 | 50 | | 150 |
| | **Capacity Building** | **33** | **125** | **250** | **260** | **270** | **905** |
| 2401 | Staff Training | 33 | 125 | 250 | 260 | 270 | 905 |
| | **Total Expenditure** | **19,635** | **14,740** | **15,875** | **17,195** | **18,015** | **65,825** |
| **Total Financing** | | **19,635** | **14,740** | **15,875** | **17,195** | **18,015** | **65,825** |
| **Domestic** | | **19,635** | **14,740** | **15,875** | **17,195** | **18,015** | **65,825** |
| 11 | Domestic Funds | 19,635 | 14,740 | 15,875 | 17,195 | 18,015 | 65,825 |

# 03. ක්‍රියාකාරකම් සැලැස්ම

**1.0 යෝජිත කාර්යය:-** සැලසුම්කරණය හා පුහුණුව

| ප්‍රතිපත්ති | ක්‍රමෝපාය | යෝජිත කාර්යය | ප්‍රතිපාදන (රු.000') | ආරම්භක දිනය | අවසන් වන දිනය | මූල්‍ය ඉලක්ක (රු.000') (සමුච්චිත) | | | | භෞතික ඉලක්ක (සමුච්චිත) | | | | දර්ශක නිමැවුම | වගකීම | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | කා 1 | කා 2 | කා 3 | කා 4 | කා 1 | කා 2 | කා 3 | කා 4 | | | |
| සැලසුම්කරණය | | 1.1 වාර්ෂික සැලැස්ම සකස් කිරීම | කාරණය | 01.01.2019 | 31.01.2018 | | | | | √ | | | | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම | ලේකම් | |
| | | 1.2 ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | කාරණය | 01.01.2019 | 31.12.2019 | | | | | 1 | 2 | 3 | 4 | පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව | ලේකම් | |
| පුහුණුව | | 1.3 කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා පුහුණුව ලබාදීම | කාරණය | 01.01.2019 | 31.12.2019 | | | | | | √ | √ | | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව හා පුහුණු කළ සේවක සංඛ්‍යාව | ලේකම් | |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | | 1.4 සීමා නිර්ණය ගැටලු පිළිබඳ දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සාකච්ඡා පැවැත්වීම | කාරණය | 01.01.2019 | 31.12.2019 | | | | | 1 | 2 | 3 | 4 | පැවැත්වූ සාකච්ඡා ගණන | ලේකම් | |

**2.0 යෝජිත කාර්යය :-** තොරතුරු එක් රැස් කිරීම

| ප්‍රතිපත්ති | ක්‍රමෝපාය | යෝජිත කාර්යය | ප්‍රතිපාදන (රු.000') | ආරම්භක දිනය | අවසන් වන දිනය | මූල්‍ය ඉලක්ක (රු.000') (සමුච්චිත) | | | | භෞතික ඉලක්ක (සමුච්චිත) | | | | දර්ශක නිමැවුම | වගකීම | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | කා 1 | කා 2 | කා 3 | කා 4 | කා 1 | කා 2 | කා 3 | කා 4 | | | |
| | | **2.1** තොරතුරු /ගැසට් එක් රැස් කිරීම- පළාත් පාලන ආයතන (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා) වල මායිම් | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | සියලුම ගැසට් නිවේදන කොමිෂන් සභාව සතු වීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |
| | | 2.2 තොරතුරු /ගැසට් එක් රැස් කිරීම- පරිපාලන කොට්ඨාස මායිම් (පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිලධාරී කොට්ඨාස) | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | සියලුම ගැසට් නිවේදන කොමිෂන් සභාව සතු වීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |

**3.0 යෝජිත කාර්යය :-** ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහණය හා ඉඩකඩම් පිළිබඳ ප්‍රමුඛතා පෙරදැරිකොට පසුගිය පාර්ලිමේන්තු ඡන්ද විමසීම් හා බැඳි සීමා නිර්ණය වාර්තා විශ්ලේෂණය කිරීම

| ප්‍රතිපත්ති | ක්‍රමෝපාය | යෝජිත කාර්යය | ප්‍රතිපාදන (රු.000') | ආරම්භක දිනය | අවසන් වන දිනය | මූල්‍ය ඉලක්ක (රු.000') (සමුච්චිත) | | | | භෞතික ඉලක්ක (සමුච්චිත) | | | | දර්ශක නිමැවුම | වගකීම | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | කා 1 | කා 2 | කා 3 | කා 4 | කා 1 | කා 2 | කා 3 | කා 4 | | | |
| | | 3.1. 1946; 1959; 1976; 1981; 1988. පාර්ලිමේන්තු ඡන්ද විමසීම් විශ්ලේෂණය | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | පූර්ව සීමා නිර්ණය වාර්තා විසින් අධ්‍යයනය කර තිබීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |
| | | 3.2 වර්තමාන මැතිවරණ කොට්ඨාස මායිම් අධ්‍යයනය කිරීම හා යෝජිත මැතිවරණ කොට්ඨාස සමග ගලපා බැලීම | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | අධ්‍යයනය අවසන්කර ඇති බව | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |
| | | 3.3 පළාත් සභා ඡන්ද කොට්ඨාස මායිම් අධ්‍යයනය කිරීම | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | වාර්තාව සමාලෝචනය කර අවසන්ව තිබීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |

**4.0 යෝජිත කාර්යය :- පරිපාලන කොට්ඨාස වල සීමා පිළිබඳව අධ්‍යයනය**

| ප්‍රතිපත්ති | ක්‍රමෝපාය | යෝජිත කාර්යය | ප්‍රතිපාදන (රු.000') | ආරම්භක දිනය | අවසන් වන දිනය | මූල්‍ය ඉලක්ක (රු.000') (සමුච්චිත) | | | | භෞතික ඉලක්ක (සමුච්චිත) | | | | දර්ශක නිමැවුම | වගකීම | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | කා 1 | කා 2 | කා 3 | කා 4 | කා 1 | කා 2 | කා 3 | කා 4 | | | |
| | | 4.1 පළාත් හා දිස්ත්‍රික්ක සීමා නිර්ණයන් අධ්‍යයනය කිරීම | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | අධ්‍යයනය අවසන් වී තිබීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |
| | | 4.2 වර්තමාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අධ්‍යයනය කිරීම | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | අධ්‍යයනය අවසන් වී තිබීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |
| | | 4.3 ග්‍රාම නිලධාරී කොට්ඨාස මායිම් අධ්‍යයනය හා නැවත සීමා නියම කිරීම් යෝජනා කිරීම | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | අධ්‍යයනය අවසන් වී තිබීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |

## 5.0 **යෝජිත කාර්යය:-** පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීම පිළිබඳ අධ්‍යයනය

| ප්‍රතිපත්ති | ක්‍රමෝපාය | යෝජිත කාර්යය | ප්‍රතිපාදන (රු.000') | ආරම්භක දිනය | අවසන් වන දිනය | මූල්‍ය ඉලක්ක (රු.000') (සමුච්චිත) | | | | භෞතික ඉලක්ක (සමුච්චිත) | | | | දර්ශක නිමැවුම | වගකීම | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | කා 1 | කා 2 | කා 3 | කා 4 | කා 1 | කා 2 | කා 3 | කා 4 | | | |
| | | 5.1 ප්‍රාදේශීය සභා සීමා අධ්‍යයනය | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | අධ්‍යයනය අවසන් වී තිබීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |
| | | 5.2 මහ නගර සභා සීමා අධ්‍යයනය. | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | අධ්‍යයනය අවසන් වී තිබීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |
| | | 5.3 නගර සභා සීමා අධ්‍යයනය | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | අධ්‍යයනය අවසන් වී තිබීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |

**6.0 යෝජිත කාර්යය:-** වර්තමානයට ගැළපෙන වාර්තා / ලේඛනාගාරයක් සකස් කිරීම හා ලේඛනවල මෘදුකාංග පිටපත් සකස් කිරීම

| ප්‍රතිපත්ති | ක්‍රමෝපාය | යෝජිත කාර්යය | ප්‍රතිපාදන (රු.000') | ආරම්භක දිනය | අවසන් වන දිනය | මූල්‍ය ඉලක්ක (රු.000') (සමුච්චිත) | | | | භෞතික ඉලක්ක (සමුච්චිත) | | | | දර්ශක නිමැවුම | වගකීම | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | කා 1 | කා 2 | කා 3 | කා 4 | කා 1 | කා 2 | කා 3 | කා 4 | | | |
| . | | 6.1 වර්තමානයට ගැළපෙන වාර්තා / ලේඛනාගාරයක් සකස් කිරීම | කාරණය | 01.01.2019 | 31.12.2019 | √ | √ | √ | √ | √ | √ | √ | √ | වාර්තා සකස් කර අවසන් කිරීම | කොමිෂන් සභා සාමාජිකයන් හා ලේකම් | |

## 04. ප්‍රසම්පාදන සැලැස්ම

| අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රසම්පාදන වර්ගය (භාණ්ඩ, කාර්යයන්, උපකරණ සහ සේවා ආදිය) | ඇස්තමේන්තුගත වියදම (රු.) | මූල්‍යකරණ ප්‍රභවය /ප්‍රදායකයාගේ නම | ප්‍රසම්පාදන ක්‍රමය (අ.ත.ලං, ජා.ත.ලං සහ ජාතික භාණ්ඩ මිලදී ගැනීම් ආදිය) | අධිකාරී බල මට්ටම (CAPC,MPC,DPC,PPC ආදිය ) | ප්‍රමුඛතා තත්වය<br>හ = හදිසි<br>ප්‍ර = ප්‍රමුඛ<br>සා = සාමාන්‍ය | ප්‍රසම්පාදන සැකසීමේ ක්‍රියාවලියේ වර්තමාන තත්වය | ආරම්භ කිරීමට නියමිත දිනය | අවසන් කිරීමට නියමිත දිනය | සටහන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ 01 | භාණ්ඩ | 70,000.00 | | ජාතික භාණ්ඩ මිලදී ගැනීම | DPC | සාමාන්‍ය | | 1/5/2019 | 1/8/2019 | |
| 2 | මුද්‍රණ යන්ත්‍ර (A3 Colour Printer) 01 | භාණ්ඩ | 250,000.00 | | ජාතික භාණ්ඩ මිලදී ගැනීම | DPC | සාමාන්‍ය | | 1/5/2019 | 1/8/2019 | |
| 3 | CD ලේඛන යන්ත්‍ර (Multi dvd/cd writer) 01 | භාණ්ඩ | 50,000.00 | | ජාතික භාණ්ඩ මිලදී ගැනීම g | DPC | සාමාන්‍ය | | 1/5/2019 | 1/8/2019 | |
| 4 | ප්‍රක්ෂේපක ( Multi Media Projector ) 01 | භාණ්ඩ | 100,000.00 | | ජාතික භාණ්ඩ මිලදී ගැනීම | DPC | සාමාන්‍ය | | 1/5/2019 | 1/8/2019 | |
| 5 | මෘදුකාංග සංවර්ධනය (Software Development) | කාර්යයන් | 100,000.00 | | ජාතික භාණ්ඩ මිලදී ගැනීම | DPC | සාමාන්‍ය | | 1/5/2019 | 1/8/2019 | |

# 05. අනුමත වියදම් සැලසුම් අනුව මාසික / කාර්තුමය මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | වියදම් අයිතමයන් (වැය විෂය සංකේත අංකය සහිතව) | අනුමත වියදම් සැලසුම් අනුව මාසික මුදල් අවශ්‍යතාවය | | | | | | | | | | | | | | | | රු.'000 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජන | පෙබ | මාර්තු | 1 වන කාර්තුවේ එකතුව | අප්‍රේ. | මැයි | ජුනි | 2 වන කාර්තුවේ එකතුව | ජූලි | අගෝ. | සැප්. | 3 වන කාර්තුවේ එකතුව | ඔක්. | නොවැ. | දෙසැ. | 4 වන කාර්තුවේ එකතුව | මුලු එකතුව |
| I | පුද්ගල පඩිනඩි (1001 සහ 1003 ) | 625 | 625 | 677 | **1,927** | 701 | 896 | 846 | **2,443** | 846 | 846 | 841 | **2,533** | 841 | 841 | 842 | **2,524** | **9,427** |
| | වැටුප් සමග ගෙවන අනෙකුත් දීමනා (1003 වැය විෂය හැර) | 144 | 143 | 168 | **455** | 181 | 188 | 188 | **557** | 188 | 188 | 193 | **569** | 193 | 193 | 193 | **579** | **2,160** |
| II | අතිකාල හා නිවාඩු දින වැටුප් (1002) | 2 | 21 | 19 | **42** | 20 | 20 | 18 | **58** | | | | - | | | | - | **100** |
| III | අනෙකුත් සියලුම පුනරාවර්තන වියදම් | 84 | 64 | 27 | **175** | 50 | 336 | 336 | **722** | 336 | 336 | 336 | **1,008** | 296 | 296 | 298 | **890** | **2,795** |
| | පුනරාවර්තන එකතුව | 855 | 853 | 891 | **2,599** | 952 | 1,440 | 1,388 | **3,780** | 1,370 | 1,370 | 1,370 | **4,110** | 1,330 | 1,330 | 1,333 | **3,993** | **14,482** |
| IV | ප්‍රතිපූර්ණය කල හැකි විදේශාධාර | | | | | | | | - | | | | - | | | | - | |
| V | අනෙකුත් සියලුම ප්‍රාග්ධන වැය සඳහා | | | | - | | | 136 | **136** | 136 | 136 | 136 | **408** | 136 | 140 | | **276** | **820** |
| VI | ර.නි.ණය සහ අත්තිකාරම් | | | | - | 40 | 100 | 100 | **240** | 100 | 100 | 110 | **310** | 100 | 100 | 100 | **300** | **850** |
| VII | තැම්පත් ගිණුම | | | | | | | | - | | | | - | | | | - | |
| VIII | වෙනත් අත්තිකාරම් ගිණු | | | | | | | | - | | | | - | | | | - | |
| | මුලු එකතුව | **855** | **853** | **891** | **2,599** | **992** | **1,540** | **1,624** | **4,156** | **1,606** | **1,606** | **1,616** | **4,828** | **1,566** | **1,570** | **1,433** | **4,569** | **16,152** |